# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1425/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 03/09/2024<br>පැය 1105 |

## මාධ්‍ය නිවේදනය

### 01. දේපල සොරකම් කිහිපයකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.

මතුගම පොලිස් වසමේ රෙදිපිළි වෙළඳසැලක් බිඳ රුපියල් ලක්ෂ 53 කට අධික වටිනාකමින් යුත් දේපල සොරකමක් සම්බන්ධයෙන් ලද පැමිණිල්ලක් මත කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරින් විසින් විමර්ශනයක් සිදුකර 2024.09.02 වන දින උදෑසන කාලයේ සැකකරුවන් තිදෙනෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට ගෙන මතුගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24, 37 හා 49 වයස්වල පසුවන බදුරලිය, අවුලේගම, බෝගස්වැව ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 29 ක් වූ දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

සැකකරුවන් බෝගස්වැව සහ මැදවච්චිය පොලිස් වසම්වල දේපල සොරකම් 02 කට අවශ්‍ය කර සිටි සැකකරුවන් බවට අනාවරණය වී ඇත. සොරකම් කරන ලද බතික් සාරි, ගවුම්, සරම්, ෂර්ට් ඇතුළු රෙදිපිළි තොගයක්, විද්‍යුත් තරාදියක්, විදුලි කේතල් 02 ක්, ගෑස් සිලිණ්ඩරයක්, ඩී.වී.ආර්. යන්ත්‍රයක්, රයිස් කුකර් එකක්, ගෑස් ලිපක්, වියළි ආහාර ද්‍රව්‍ය තොගයක් ඇතුළු දේපල රැසක් සහ සොරබඩු ප්‍රවාහනයට යොදා ගත් කාර් රථයක් සොයා ගෙන ඇත. මතුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.

2024.09.02 වන දින උදෑසන කාලයේ මෝදර පොලිස් වසමේ කාලි කෝවිල ප්‍රදේශයේදී මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 300** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන අළුත් මාවත කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.09.02 වන දින රාත්‍රි කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන සයිබු වීදිය, කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**